**කාර්මික තාක්ෂණ ආයතනය - 2018**

**-------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-------------------------------------**

කාර්මික තාක්ෂණ ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ගිණුම් තැබීම සඳහා ආයතනයේ ක්‍රියාත්මක වන පරිගණක වැඩසටහන් ක්‍රමය නිසි ලෙස ක්‍රියාත්මක නොවීම නිසා ගිණුම්කරණය පරීක්ෂා කිරීම අසීරු විය. | _ | ආයතනයේ ගිණුම්කටයුතු වලට අවශ්‍ය සියළුම තොරතුරු ඇතුලත් වන පරිදි නිසි ලෙස ක්‍රියාත්මක වන පරිගණක ගිණුම් ක්‍රමයක් ස්ථාපිත කළ යුතු බව. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 09(35) වන වගන්තිය අනුව අවසන් භාණ්ඩ තොග පිරිවැය ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීම් (FIFO) හෝ භරිත සාමාන්‍ය ක්‍රමය (WAC) යන පිරිවැය ක්‍රම යොදා ගනිමින් නිශ්චය කළ යුතු වුවද ආයතනය එකී ක්‍රම අනුගමනය නොකොට සරල සාමාන්‍ය පිරිවැය ක්‍රමය මත ගිණුම්ගත කර තිබුණි. | පවතින පරිගණක පද්ධතිය සරල සාමාන්‍ය පිරිවැය ක්‍රමය පදනම් කරගෙන නිර්මාණය කර ඇති අතර FIFO හෝ WAC ක්‍රමය අනුව තොග ගණනය සිදු කිරීමට අවශ්‍ය පහසුකම් නොමැත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයේ පරිභෝජන භාණ්ඩ තොගයේ 2018 දෙසැම්බර් 31 දිනට භෞතික තොග පරීක්ෂණ වාර්තා අනුව වටිනාකම රු.14,690,110 ක් වුවත් එය රු.15,450,513 ක් ලෙස අවසන් ගිණුම්වල දැක්වීමෙන් භාණ්ඩ තොගයේ වටිනාකම රු.760,403 ක් වැඩියෙන් දක්වා තිබුණි. | භෞතික තොග පරීක්ෂණ වාර්තාව අනුව අගය සහ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගය අතර වෙනසට හේතුන් විශ්ලේෂණය කොට සැසඳුම් වාර්තාවක් සකසා ඒ අනුව අවශ්‍ය කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශන වල සඳහන් අයිතමයන් හා ඒවාට අදාළ වාර්තා සමඟ සැසඳීම්කර ඉදිරිපත් කළයුතු බව. |
| (ආ) | මාලබේ පර්යේෂණ හා සංවර්ධන ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ පිරිවැය රු.40,000,000 ගොඩනැගිලි ලෙස 2017 වර්ෂයේදී දැක්වීම නිවැරදි කර තිබුණද එම ඉඩමේ පිරිවැය මත සියයට 5 කින් ක්ෂය කිරීම නිවැරදි කර නොතිබුණි. මේ හේතුවෙන් සමුච්චිත ක්ෂය වෙන්කිරීමේ වටිනාකම රු.2,000,000 වැඩියෙන්ද සමාලෝචිත වර්ෂයේ ක්ෂය වෙන්කිරීම ආරම්භක ශේෂය මත පදනම්ව සිදුකිරීම නිසා ක්ෂය වෙන්කිරීම රු.2,000,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වසරේදී ගොඩනැගිලි ක්ෂය වීම් නිසිපරිදි ගැලපීමට සටහන් කර ගතිමි. | මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි තොරතුරු ඉදිරිපත් කළයුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | විද්‍යා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය කාර්යාලය හා තාක්ෂණික පැවරුම් ඒකකය බෞද්ධාලෝක මාවතේ පිහිටි කාර්මික තාක්ෂණ ආයතනය ගොඩනැගිල්ල තුළ පවත්වාගෙන යාම වෙනුවෙන් මසකට රු. 1,368,050 ක කුලියක් අයකර ගැනීමට ගිවිසගෙන තිබුණි. ඒ අනුව 2018 ජනවාරි 01 දින සිට සැප්තැම්බර් 26 දක්වා මාස 09 ක කාලයක් වෙනුවෙන් රු.12,312,450 ක් ආයතනයට ලැබිය යුතු වුවත් එසේ ලැබිය යුතු කුලිය කුලී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | විද්‍යා තාක්ෂණ පර්යේෂණ අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ඉඩපහසුකම් ලබාදීම වෙනුවෙන් 2017 වසර සඳහා අයවිය යුතු වටිනාකම මේ වන තෙක් නොලැබීම හා මෙම ආදායම රේඛීය අමාත්‍යාංශයෙන් අයවිය යුතු මුදලක් බැවින් එය උපලබ්ධි නොවුනහොත් ආයතනයේ ආදායම අධිගණනය වන බැවින් කුලී ආදායම මුදලින් ලද පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයේ ලැබියයුතු ආදායම් ඊට අදාල ආයතන වලින් අයකර ගැනීමට හා එම ආදායම් මූල්‍ය ප්‍රකාශන තුලින් ඉදිරිපත් කිරීමට කටයුතු කලයුතු බව. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී පාරිතෝෂික හා දිරිදීමනා ගෙවීම රු.40,039 ක් අඩුවෙන් දැක්වීමෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් වටිනාකම රු. 40,039 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සම්බන්ධ අදාල ප්‍රවාහයන් පිළිබඳව නැවත විශ්ලේෂණය කිරීමට සටහන් කර ගතිමි. | ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කලයුතු බව. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී ප්‍රවර්තන වර්ෂයේ පොලී ලැබීම් රු.23,798,804 ක් වුවත් එය රු.20,569,727 ක් ලෙස දැක්වීමෙන් මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.3,229,077 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට සම්බන්ධ අදාල ප්‍රවාහයන් පිළිබඳව නැවත විශ්ලේෂණය කිරීමට සටහන් කර ගතිමි. | ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව පිළියෙල කලයුතු බව. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | | |
| (අ) සේවා සැපයීමේ ආදායම | 290,335,090 | 294,575,089 | 4,239,999 | ප්‍රකාශිත ආදායමේ හා බදු වාර්තාවලට අනුව ආදායමේ වෙනසට හේතුන් වනුයේ වෙනත් මෙහෙයුම් ආදායම් වේ.එය මුල්‍ය ප්‍රකාශ වල වෙනම දක්වා ඇත. | මුල්‍ය ප්‍රකාශන වල සඳහන් අයිතමයන් එම අයිතමයන්ට සම්බන්ධිත වෙනත් අගයන් සමඟ සැසඳිය යුතු බව හා වෙනස්නම් වලට හේතුන් නිවැරදිව ඉදිරිපත් කලයුතු බව. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (ආ) | අයිතම 3 කට අදාල ජංගම නොවන වත්කම් | 1,393,292,11 9 | 1,368,405,454 | 24,886,665 | මේ පිළිබඳව තව දුරටත් සොයාබලා අවශ්‍ය කටයුතු සිදුකරනු ඇත. | මුල්‍ය ප්‍රකාශන වල සඳහන් අයිතමයන් එම අයිතමයන්ට සම්බන්ධිත වෙනත් අගයන් සමඟ සැසදිය යුතු බව හා වෙනස්නම් වලට හේතූන් නිවැරදිව ඉදිරිපත් කලයුතු බව. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වූ අයිතම 10 කින් සමන්විත එකතුව රු.3,433,566 ක ණයගැති ශේෂ සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට පියවරගෙන නොතිබුණි. | මේ පිළිබඳව අදාල ණයගැතියන් දැනුවත් කර ඇති අතර අයකර ගැනීමට උත්සාහ කරඇත.එහෙත් මේ වන තෙක් අදාළ ලැබීම් ලැබී නොමැත. | ආයතනයට අයවිය යුතු ණය මුදල් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කලයුතු බව. |
| (ආ) | වර්ෂ ගණනාවක සිට අයවිය යුතු විදේශ ශිෂ්‍යත්ව සඳහා ඇති කරගත් ගිවිසුම් කඩ කළ නිලධාරින් 18 දෙනෙකුගෙන් අයවිය යුතු රු.7,610,032 ක මුදලක් පවතින අතර මෙම මුදල් අයකර ගැනීම සඳහා ආයතනය විධිමත් වැඩපිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. | වසර 15 හි ගිවිසුම් කඩකළ නිලධාරීන් 17 දෙනෙකුගෙන් අදාළ මුදල් අයකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග වාර්ථා වූයේ එම නිලධාරීන් දිවයින හැරගොස් සිටින බැවිනි.ඔවුන්ගේ බොහෝ ඇප කරුවන්ද දිවයිනෙන් බැහැරවගොස් සිටින අතර ඇතැමෙක් ජීවතුන් අතර නැත.<br>ගිවිසුම් කඩකල නිලධාරීන්ගේ කාල විශ්ලේෂණයක් පහත දක්වා ඇත.<br>වසර 30 වැඩි නිලධාරීන් 04,වසර 20 වැඩි නිලධාරීන් 08, වසර 10 වැඩි නිලධාරීන් 06<br>රු.3,789,640ක් වටිනා ගිවිසුම් කඩකල නිලධාරිනිය සම්බන්ධව අවශ්‍ය කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමඟ මේ වන විටත් සිදුකෙරෙමින් පවතී. | විදේශ ශිෂ්‍යත්ව ගිවිසුම් කඩකල නිලධාරින්ගෙන් මුදල් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ලැබිය යුතු ණය ශේෂය වූ රු.29,465,485 ක මුදල තුළ වසර 06 කට වැඩි කාලයක සිට අයවිය යුතු ණය ශේෂ 304 ක් පවතින අතර එම වටිනාකම රු.9,302,126 ක් විය. | 2005 වසරටත් පෙර සිට ගිණුම් තුල ඇති වූ අඟරු චෙක්පත් හා වෙනත් ණයගැති ශේෂ සඳහා අවස්ථා ගණනාවකදී ශේෂ තහවුරු කිරීමේ ලිපි යොමුකල අතර කිසිදු ප්‍රතිචාරයක් අදාළ පාර්ශවයන්ගෙන් නොලැබිණි.<br>එම නිසා එකී ශේෂයන්ගේ වටිනාකම පොත්වලින් ලියා හැරීමට විගණන හා කළමනාකරණ කමිටුවෙන් හා පාලකමණ්ඩලයෙන් අනුමැතිය ලබාගැනීමට කටයුතු කරනු ලැබේ. | ආයතනයට අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුයි. |

## 1.6.2 ගෙවිය යුතු මුදල්

මෙහිදී පහත සඳහන්කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 09 සිට වසර 02 කාලසීමාවක් දක්වා කාල පරාසය සිට පැවත එන අයිතම 9 කින් සමන්විත වූ රු.7,951,560 ක අගයකින් යුක්ත උපචිත වියදම් පියවා දැමීමට හෝ ඒ පිළිබඳ වගකීමක් නොමැති නම් පොත්වලින් ලියාහැරීමට ආයතනය කටයුතු කර නොතිබුණි. | මෙම අයිතම 09 තුල එක් අයිතමයක් රු.මිලියන 6.8ක් වන සේවක හිඟ වැටුප් හා දීමනා ගෙවීමට අදාල වන අතර එය විටින් විට භාවිතා කරමින් අදාළ ගෙවීම් කර ඇත.එහි ඉතිරිය පිළිබඳව මානව සම්පත් අංශය සමඟ සාකච්ඡාකොට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.අනෙකුත් අයිතමයන් මත සඳහන් වන මුදල් නැවත අයකර ගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී ගනු ලැබේ. | උපචිත වියදම් පිළිබඳ විස්තර ලබාගෙන පියවා දැමීමට හෝ එසේ නැතිනම් ගිණුම්වලින් ගැලපීම් කිරිමට කටයුතු කලයුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

මෙහිදී පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර ලේඛනයේ 2016 ජනවාරි 08 දිනැති හා අංක 1/2016 දරන චක්‍රලේඛයේ 3 වන ඡේදය | රජයට අවශ්‍ය පරිදි හදිසි සේවා ඉටුකිරීම වෙනුවෙන් දින 60 නොඉක්ම වන්නා වූ කෙටිකාලීන පදනම මත නිලධාරීන් බඳවාගෙන ඒ සඳහා ගෙවිය හැකි උපරිම මුදල රු.60,000 ක් බව දක්වා තිබුණද, ඒ කෙරෙහි අවධානය යොමු නොකොට ආයතනයේ නිලධාරීන් 19 දෙනෙකුට පාලක මණ්ඩලයේ අනුමැතිය මත රු.10,299,805 ක් ගෙවා තිබුණි. | බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඇති වූ පමාවීම් නිසා ආයතනයේ මෙහෙයුම් කටයුතු ඉටුකර ගැනීමට පාලක මණ්ඩලයේ අනුමැතිය සහිතව පැවරුම් පදනම මත සේවකයන් බඳවා ගන්නා ලදී. එය ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා නොයන පරිදි සිදුකර ඇත. | භාණ්ඩාගාර චක්‍රෙල්ඛ යේ උපදෙස් අනුව කටයුතු කලයුතු බව. |

## 1.8 මුදල් කළමනාකරණය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.1,819,200 ක් වූ බැංකු ගිණුම් ශේෂ 04 ක් අක්‍රීය බැංකු ගිණුම් ලෙස වසර 05 කට අධික කාලයක සිට පවත්වාගෙන ගොස් තිබුණි. | මෙම බැංකු ගිණුම් සින්ටෙක් ව්‍යාපෘතිය, කෙයාර් ව්‍යාපෘතිය, ඊ්පීර් එක්ස් ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතීන්ට අයත්වේ.මෙයින් ගිණුම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම මත අරමුදල් කිහිපයක් නැවත ලබාදිය යුතු වේ. | අක්‍රීය ජංගම ගිණුම් වසා නැවත එම මුදල් ආයතනික කටයුතු සඳහා උපයෝජනය කරගත යුතු බව |

## 1.9 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ එකතු කළ අගය මත බදු වටිනාකම (VAT) හා ආර්ථික සේවා ගාස්තු පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය. | මෙම බැංකු ගිණුම් සින්ටෙක් ව්‍යාපෘතිය, කෙයාර් ව්‍යාපෘතිය, ඊ්පීර් එක්ස් ව්‍යාපෘතිය වැනි ව්‍යාපෘතීන්ට අයත්වේ.මෙයින් ගිණුම් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත.අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම මත අරමුදල් කිහිපයක් නැවත ලබාදිය යුතු වේ. | බදු ගෙවීම් පිළිබඳව වාර්තා විගණනයට ඉදිරිපත් කලයුතු බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,252,426 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.4,508,341 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,760,767ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

2017 වර්ෂයේ ජංගම අනුපාතය 2.28:1 ක් වූ අතර 2018 වර්ෂයේ එය 2.76:1 ක් විය. 2017 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී කාරක ප්‍රාග්ධනයේ වර්ධනයක් පෙන්නුම් කෙරුණි. වෙළෙඳ හා අනෙකුත් ලැබීම් වැඩිවීම මෙම වර්ධනයට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වර්ෂය තුළදී රු.294,576,000 ක් වටිනා ජංගම නොවන වත්කම් ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විට එයින් රු.35,150,000 ක් වටිනා වත්කම් ප්‍රමාණයක් එනම් මුළු වටිනාකමෙන් සියයට 11.93 ක් පමණ ප්‍රසම්පාදනය කිරීමට කටයුතු කර තිබුණි. එකී ප්‍රසම්පාදනයන්ගෙන් රු.3,608,328 ක් වටිනා වත්කම් ප්‍රමාණයක් පමණක් 2018 දෙසැම්බර් 31 දිනට ආයතනයට ලැබී තිබූ අතර ඉතිරි රු.31,541,772 ක් වටිනා වත්කම් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර තිබූ අතර එම ප්‍රසම්පාදනයන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ මූලික අදියරෙහි පැවතුණි. | කාර්මික තාක්ෂණ ආයතනයේ 2018 වසර සඳහා ඇස්තමේන්තු ගත මුළු ප්‍රසම්පාදන වියදම රු.මිලියන 350ක් වන අතර සත්‍ය වියදම රු.මිලියන 250.2ක් විය.ඒ අනුව කාර්මික තාක්ෂණ ආයතනයේ ප්‍රසම්පාදනයේ ප්‍රගතිය සියයට 71.5 ක් බව සඳහන් කිරීමට කැමැත්තෙමි. | වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව එම ප්‍රසම්පාදනයන් කර ගැනීමට කටයුතු කළ යුතු අතර ප්‍රසම්පාදනයන් සිදුකර ඇති භාණ්ඩ හා උපකරණ කාලීනව ආයතනය වෙත ලබාගැනීමට කටයුතු කලයුතු බව. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළුව තනතුරු 13 ක් වසර ගණනාවක සිටම පුරප්පාඩුව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.<br>තනතුරු 03 ක් සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට 2017 අගෝස්තු 20 වන දින පුවත්පත් දැන්වීම් පළකර තිබුණද 2018 දෙසැම්බර් 31 දින වන විටත් බඳවා ගැනීම් සිදු කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ තත්ත්ව සහතික කිරීමේ නිලධාරී තනතුර සඳහා ආයතනයේ ආයතනයේ 2018 ජූලි 10 දින පැවති කළමනාකරණ මණ්ඩල තීරණයකට අනුව 2017 අගෝස්තු මස පලකරන ලද පුවත්පත් දැන්වීම නැවතත් පල කිරීමට තීරණය කරන ලද අතර 2018.07.12 දින නැවතත් පුවත්පත් දැන්වීම් පල කරන ලදී.එම දැන්වීමට අනුව තනතුරු 36ක් සඳහා පුරප්පාඩු පැවති අතර ආයතනයේ අවශ්‍යතාවය මත ප්‍රමුඛත්වය ලබාදී තනතුරු ගණනාවක් සඳහා මේවන විට බඳවා ගැනීම් සිදුකොට ඇත. ජ්‍යෙෂ්ඨ තත්ත්ව සහතික කිරීමේ නිලධාරී තනතුර සඳහා ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇත.<br>ජ්‍යෙෂ්ඨ පරිගණක පද්ධති ඉංජිනේරු තනතුර සඳහාද ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇත.<br>අලෙවිකරණ නිලධාරී තනතුර සඳහා 2018.10.26 දින සම්මුඛ පරීක්ෂණ පැවැත්වූ අතර එම තනතුර සඳහා තෝරාගත් අයදුම්කරුවෙත 2018.12.17 දින සිට පත්වීම පිරිනමා ඇති නමුත් ඔහු විසින් කල් ඉල්ලා ඇති බැවින් 2019.02.14 දින බඳවා ගැනීම සිදුකරන ලදී. | ආයතනයේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කලයුතු බව. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර වසර ගණනාවක සිටම පුරප්පාඩුව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා කිහිපවරක් (2014.10.12,2015.01.04 සහ 2016.09.03 දින වල)පුවත්පත් දැන්වීම් පලකල නමුත් ඒසඳහා සුදුසුකම්ලත් අයදුම්පත් නොලැබුණි.ඒ අනුව 2018.07.12නැවතත් පුවත්පත් දැන්වීම් පලකරන ලද අතර ඉදිරියේදී සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට නියමිතව ඇත. | ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගැනීමට කටයුතු කලයුතු බව. |